**නැවත පදිංචි කරවීමේ අධිකාරිය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කරවීමේ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

අධිකාරිය වෙත ඉකුත් වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු.5,600,000 ක් වටිනා ඩබල් කැබ් රථය එම වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. එම වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස ගිණුම්ගත නොකර අයභාර ප්‍රදානයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.5,600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත<br>(i) I කොටසේ 12 වගන්තිය | උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා එම ප්‍රදේශවල ශාඛා කාර්යාල පිහිටුවීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. |
| (ii) III කොටසේ 20(1) වගන්තිය | අධිකාරියට අරමුදලක් තිබිය යුතු වුවත්, එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.4,625,545 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.460,091 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,165,454 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ. ඉකුත් වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.5,600,000 ක් වටිනා කැබ් රථය සමාලෝචිත වර්ෂයෙදී ආදායමක් ලෙස දක්වා තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නැවත පදිංචි කරවීමේදී මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටළු වන ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම්, හානිවූ නිවාසවලට පිළියම් යෙදීම, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ සුභ සාධනය හා අභිවෘද්ධිය ඇතුළු ක්ෂණික මානුෂීය ආධාර ලබාදීම හා යටිතල පහසුකම් ලබාදීම, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ මැදිහත්වීම මත නැවත පදිංචිකරවීමේ අධිකාරිය විසින් සිදුකරනු ලබයි.

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(අ) 2007 අංක 09 දරන නැවත පදිංචිකරවීමේ අධිකාරිය පනත අනුව මූලික අරමුණු 05 ක් සහ කාර්යයන් 14 ක් දක්වා තිබුණත් එම අරමුණුවලට ළඟාවිය හැකි ආකාරයේ යෝජනා සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවතැන්ව නැවත පදිංචි කළ උතුරු සහ නැගෙනහිර පළාතේ ජනතාව වෙනුවෙන් අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා එම ජනතාව නැවත පදිංචි කර ඇති එම පළාත්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික්ක 06 ක තොරතුරු පද්ධතියක් සකස් කර ගෙන තිබුණත් අධිකාරිය විසින් එම තොරතුරු උපයෝගී කරගෙන අවශ්‍ය පහසුකම් සපයාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) "දකුණේ සෙනෙහස උතුරට" යන මැයෙන් දකුණේ පවුලක් විසින් උතුරේ නැවත පදිංචි කරන ලද පවුලකට ඇති අඩුපාඩු සහ අවශ්‍යතා සපයා උපකාර කිරීමේ අරමුණින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු නමුත් එම කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණ.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ II කොටසේ පහත පරමාර්ථ සාර්ථකව ඉටුකර නොතිබුණි.

(i) 13 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ පරමාර්ථ

රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් ආරක්ෂිතව හා ගෞරවනීය ආකාරයෙන් නැවත පදිංචි කරීම හෝ අළුතින් පදිංචි කරවීම තහවුරු කිරීම, සහ

රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලැස්වීම මගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීමට සහ ඔවුන්ට සහාය ලබා දීම පිණිස එකී තැනැත්තන් නැවත පදිංචි කිරීම සහ අළුතින් පදිංචි කිරීම පහසු කරලීම යන පරමාර්ථයන් අධිකාරිය ආරම්භයේ සිටම සාර්ථකව ඉටු කර ගැනීමට සමත් වී නොතිබුණි.

(ii) 14 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ පරමාර්ථ

පනතේ 14 (අ) උප වගන්තියේ සිට (ච) උප වගන්තිය දක්වා ඉටු කළ යුතු කාර්යයන් 15 ක් සඳහන්ව තිබුණත් 2013 දෙසැම්බර් 20 දින දක්වා එම කිසිදු කාර්යයක් සාර්ථකව සම්පූර්ණ කර ගැනීම සඳහා අධිකාරිය කටයුතු කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධිකාරියට ආරම්භයේ සිටම වාර්ෂික අයවැය මගින් පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, අධිකාරියට අවශ්‍යවන ප්‍රාග්ධන වියදම් සඳහා පතිපාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 24 ක් වූ අතර ඉන් 15ක් බඳවාගෙන වැඩ බෙදීමක් සදුකර තිබුණත් කාර්ය සාධනය පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණි.

(ආ) අධිකාරියේ 2011 නොවැම්බර් මාසයේ සිට විගණිත දිනය වු 2013 ජුනි 10 දක්වා නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වී පැවතිණි.

(ඇ) අධිකාරිය ආරම්භයේ සිටම ඉංජිනේරු ශිල්පී, තාක්ෂණ නිලධාරි සහ සැලසුම් ශිල්පී තනතුරුවල පුරප්පාඩු පැවතියද එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය කටයුතු කර නොතබීම නිසා අධිකාරියේ අරමුණු සහ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට නොහැකිවීමට එම තත්ත්වයන් හේතුවී තිබුණ.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවද, 2012/ 2013 වශයෙන් එක් වර්ෂයකට පමණක් සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණි.

### 4. 2 ක්‍රියාකාර සැලැස්ම

අධිකාරිය විසින් 2012 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාර සැලැස්මේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළදී ඉටුකර ගත යුතු අරමුණු හා ඉලක්ක සමඟ කළමනාකරුවන්ගේ වගකීම් හඳුනාගත හැකිවන පරිදි ක්‍රියාකාර සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) නිශ්චිත කාල පරිච්ඡේදය තුළ ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කිරිම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 06 ක අවතැන්වූ ජනතාවගෙ සංවර්ධන කටයුතු ඉටුකිරිම අරමුණු කරගෙන සකස් කරන ලද ක්‍රියාකාර සැලැස්මේ මූල්‍ය ප්‍රතිපාදනය රු.මිලියන 813.11 ක් වී තිබුණ. කෙසේ වුවද ඒ සඳහා අරමුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණ.

(ඇ) අධිකාරිය සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවන අවස්ථාවේදී එය යාවත්කාලීන කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු කාර්යයක් කිරීමට නොහැකිවී තිබුණ.

## 4.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි. තවද 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී වර්ෂයකට එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4 පරිච්ඡේදය අනුව මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළින් කාර්ය සාධන ඇගයීමක් කර එහි කටයුතු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කිරීමක් සිදුවී නොතිබුණි. එසේම ඉදිරියේදී කළ යුතු කාර්යභාරයන් පිළිබඳව යෝජනා කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

අධිකාරියේ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර අධිකාරියේ කළමනාකරණය වෙත වාර්තා කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අධිකාරියේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) සේවක කළමනාකරණය

(ආ) වියදම් කළමනාකරණය

(ඇ) වාහන උපයෝජනය